# උත්පත්ති කථාව

## යයි සාමාන්‍යයෙන් කියනුලබන

## මෝසෙස්ගේ පළමුවෙනි පොත

### මැවීම

1 පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්
සේ අහසත් පොළොවත් මැවූ
2 සේක. පොළොව වනාශී පාළුව හිස්ව
තිබුණේය; ගැඹුර පිට අන්ධකාරය විය.
දෙවියන්වහන්සේගේ ආත්මය ජල
3 මතුයෙහි හැසිරෙමින් සිටිසේක. දෙවි
යන්වහන්සේ: එළිය වේවයි කීසේක;
4 එවිට එළිය විය. එළිය යහපත් බව
දෙවියන්වහන්සේ දුටුසේක. දෙවියන්
වහන්සේ අන්ධකාරයෙන් එළිය වෙන්
5 කොට එළියට දවාලය කියාද අන්ධකා
රයට රාත්‍රිය කියාද නාම් තැබූසේක.
සවස විය, උදය විය, ඒ එක දවසක්ය.
6 දෙවියන්වහන්සේ: ජල මධ්‍යයෙහි
අවකාශයක් වේවා, එය කාරණකොට
ගෙන ජලය ජලයෙන් වෙන්වේවයි
7 කීසේක. දෙවියන්වහන්සේ අවකාශය
සාදා අවකාශයට උඩින් තිබුණු ජල
යෙන් අවකාශයට යටින් තිබුණු ජලය
8 වෙන්කළසේක; ඒ එසේ විය. දෙවි
යන්වහන්සේ අවකාශයට අහසය කියා
නාම් තැබූසේක. සවස විය, උදය විය,
ඒ දෙවෙනි දවසක්ය.
9 දෙවියන්වහන්සේ: අහසට යටින්
තිබෙන ජලය එක් තැනකට රැස්
වේවා, වියළි බිම පෙනේවයි කීසේක.
10 ඒ එසේ විය. දෙවියන්වහන්සේ: වියළි
බිමට පොළොවය කියාද රැස්වූ ජලයට
මුහුදය කියාද නාම් තැබූසේක. දෙවි
යන්වහන්සේ ඒ යහපත් බව දුටුසේක.
දෙවියන්වහන්සේ: පොළොව වනාශී 11
තෘණද බීජ උපදවන පලාද ඒ ඒ වගී
ලෙස ඵල දරන බීජ සහිත ඵල වෘක්ෂද
පොළොව පිට හටගත්වාවයි කීසේක.
ඒ එසේවිය. තෘණද ඒ ඒ වගී ලෙස 12
බීජ උපදවන පලාද ඒ ඒ වගී ලෙස
බීජ සහිත ඵලදරන වෘක්ෂද පොළො
වෙන් හටගත්තේය. දෙවියන්වහන්සේ
ඒ යහපත් බව දුටුසේක. සවස විය, 13
උදය විය, ඒ තුන්වෙනි දවසක්ය.
දෙවියන්වහන්සේ: රාත්‍රියෙන් දවාල 14
වෙන්කිරීමට අහස්තලයෙහි ආලෝක
යෝ වෙත්වා, ඒවා ලකුණු පිණිසද
සෘතු පිණිසද දවස් පිණිසද අවුරුදු
පිණිසද වෙත්වා, පොළොවට එළිය 15
දීමට ඒවා අහස්තලයෙහි ආලෝක
යන් පිණිස වෙත්වයි කීසේක. ඒ එසේ
විය. දෙවියන්වහන්සේ මහත් ආලෝක 16
දෙක සෑදූසේක; වඩා මහත් ආලෝ
කය දිවාභාගය කෙරෙහි අධිපතිකම්
කරන පිණිසය, කුඩා ආලෝකය රාත්‍රි
භාගය කෙරෙහි අධිපතිකම් කරන
පිණිසය. උන්වහන්සේ තාරකාද සෑදූ
සේක. පොළොවට එළිය දෙන පිණි 17
සත් දවාල කෙරෙහිද රාත්‍රිය කෙ
රෙහිද අධිපතිකම් කරන පිණිසත්
අන්ධකාරයෙන් එළිය වෙන්කරන පිණි 18
සත් දෙවියන්වහන්සේ ඒවා අහස්
තලයෙහි තැබූසේක. දෙවියන්වහන්
සේ ඒ යහපත් බව දුටුසේක. සවස 19
විය, උදය විය, ඒ සතරවෙනි දව
සක්ය.

20 දෙවියන්වහන්සේ: ජලය වනාහි එහි
හැසිරෙන ජීවමාන සත්වයන් බොහෝ
කොට හටගත්වාවා, පක්ෂීහු පොළො
වට උඩින් ආකාශ කුක්ෂියෙහි පියාසර
21 කෙරෙත්වයි කීසේක. තවද දෙවි
යන්වහන්සේ ඉතා මහත් ජලචර සත්ව
යන්ද ඒ ඒ වර්ගලෙස ජලයෙහි බොහෝ
සෙයින් හටගත්තාවූ එහි හැසිරෙන
පණ ඇති සියලු සත්වයන්ද ඒ ඒ වර්ග
ලෙස පියාපත් ඇති සියලු පක්ෂීන්ද
මැවූසේක. දෙවියන්වහන්සේ ඒ යහ
22 පත් බව දුටුසේක. දෙවියන්වහන්සේ
උන්ට ආශීර්වාදකොට: තොපි සඵලව
බෝවෙමින් මුහුදු ජලය පුරා පැතිර
සිටිව්, පක්ෂීහුද පොළොවෙහි බෝ
23 වෙත්වයි කීසේක. සවස විය, උදය
විය, ඒ පස්වෙනි දවසක්ය.

24 දෙවියන්වහන්සේ: පොළොව වනාහි
ඒ ඒ වර්ග ලෙස තිරිසනුන්ද බඩගා යන
ජාතීන්ද පොළොවේ මෘගයන්ද යන
ජීවමාන සත්වයන් ඒ ඒ වර්ග ලෙස හට
ගන්වාවයි කීසේක. ඒ එසේ විය.
25 දෙවියන්වහන්සේ ඒ ඒ වර්ග ලෙස
පොළොවේ මෘගයන්ද ඒ ඒ වර්ග ලෙස
සිව්පාවුන්ද ඒ ඒ වර්ග ලෙස භූමියෙහි
බඩගා යන සියලු සතුන්ද සෑදූසේක.
දෙවියන්වහන්සේ ඒ යහපත් බව
26 දුටුසේක. තවද දෙවියන්වහන්සේ:
අපගේ ස්වරූපයෙන් අපගේ සමා
නත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ; ඔව්හු
මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකා
ශයේ පක්ෂීන් කෙරෙහිද තිරිසනුන්
කෙරෙහිද මුළු පොළොව කෙරෙහිද
පොළොව පිට බඩගා යන සියල්ලන්
කෙරෙහිද ආණ්ඩුකෙරෙත්වයි කීසේක.
27 දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන්
මනුෂ්‍යයා මැවූසේක, දෙවියන්වහන්
සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක;
පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූ
28 සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට
ආශීර්වාදකළසේක; දෙවියන්වහන්සේ
ඔවුන්ට කියනසේක්: නුඹලා බෝවී
වැඩිවෙමින් පොළොව පූර්ණකොට ඒක
යටත්කරගනිව්; මුහුදේ මත්ස්‍යයන්
කෙරෙහිද ආකාශයේ පක්ෂීන් කෙරෙ
හිද පොළොව පිට හැසිරෙන සියලු
සතුන් කෙරෙහිද අධිපතිකම් කරව්යයි
කීසේක. තවද දෙවියන්වහන්සේ: 29
බලව, මුළු පොළෝතලයෙහි ඇති
බීජ දරන සියලු පලාද බීජ දරන ඵල
ඇති සියලු වෘක්ෂයන්ද නුඹලාට දුනිමි;
එය නුඹලාට ආහාර පිණිස වන්නේය.
පොළොවේ සියලු මෘගයන්ටත් ආකාශ 30
යේ සියලු පක්ෂීන්ටත් පොළොව පිට
බඩගා යන පණ ඇති සියලු සතුන්ටත්
ආහාර පිණිස සියලු නිල් පලා දුනිමියි
කීසේක. ඒ එසේ විය. දෙවියන්වහන් 31
සේ තමන් සෑදූ සියල්ලම දුටුසේක,
බලව ඒ ඉතා යහපත්ව තිබුණේය.
සවස විය, උදය විය, ඒ සවෙනි
දවසක්ය.

2
මෙසේ අහසත් පොළොවත් එහි
මුළු සේනාවත් මවා නිමවනලද්
දේය. දෙවියන්වහන්සේ තමන් විසින් 2
කළ ස්වකීය කර්මාන්තය සත්වෙනි
දවසේ නිමකළසේක. උන්වහන්සේ
තමන් විසින් කරනලද සියලු වැඩව
ලින් සත්වෙනි දවසේ නිවාඩු ගත්
සේක. දෙවියන්වහන්සේ තමන් මැවූ 3
වාවූ සෑදුවාවූ ස්වකීය සියලු වැඩවලින්
සත්වෙනි දවසේ නිවාඩු ගත් හෙයින්
ඒ දවසට ආශීර්වාදකොට එය ශුද්ධයයි
නියමකළසේක.

## මැවීම, ඒදන් උයන

**ස්වාමිවූ** දෙවියන්වහන්සේ පොළො 4
වත් අහසත් සෑදූ දවසෙහි, ඒවා මවන
ලද කාලයෙහි, අහසත් පොළොවෙත්
මුල් ප්‍රවෘත්තිය මේය. ඒ තාක් කල් 5
වනයේ කිසි ගසක් පොළොවෙහි නො
තිබුණේය, වනයේ කිසි පලා ජාතියක්ද
හටනොගත්තේය. මක්නිසාද ස්වාමිවූ
දෙවියන්වහන්සේ පොළොව පිට වර්ෂාව
නොවස්වා තිබුණු නිසාය. භූමිය වගා
කරන පිණිස මනුෂ්‍යයෙක්ද නොසිටි
යේය. එහෙත් මීදුමක් පොළොවෙන් 6

7 නැගී මුළු භූමිතලය තෙමුවේය. **ස්වාමි**
**වූ** දෙවියන්වහන්සේ භූමියේ දූවිල්
ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස්පුඩු
තුළට ජීවනයේ හුස්ම හෙළූසේක;
එවිට මනුෂ්‍යයා ජීවමාන *ප්‍රාණයක් විය.
8 **ස්වාමිවූ** දෙවියන්වහන්සේ නැගෙන
හිර දිශාවෙහි, ඒදන්හි, උයනක් වවා
තමන් සෑදූ මනුෂ්‍යයා එහි සිටෙවූසේක.
9 දැකීමට ප්‍රියවූ කෑමට හොඳවූ සියලු
ගස්ද උයන මැද ජීවන වෘක්ෂයද
යහපත හා නපුර දැනගැනීමේ ගහද
**ස්වාමිවූ** දෙවියන්වහන්සේ භූමියෙන්
10 හටගැන්වූසේක. උයන තෙමන පිණිස
ඒදෙනෙන් ගංගාවක් නික්ම ගියාය;
එය එතැනින් බෙදී ගංගා සතරක් විය.
11 පළමුවෙනි ගංගාවේ නම පීශෝන්ය;
එය නම් රන්රන් ඇති මුළු හවීලා දේශය
12 වටේට ගලායන එකය; ඒ දේශයේ
රන්රන් හොඳය. බෙදෙලෑද වෛදූර්ය
13 ද එහි ඇත්තේය. දෙවෙනි ගංගාවේ
නම ගීහොන්ය; මුළු කූෂ් දේශය වටේට
14 වැටී තිබෙන්නේ ඒකය. තුන්වෙනි
ගංගාවේ නම †හිද්දෙකෙල්ය; අෂූර්
දේශය ‡ඉස්සරහින් ගලායන්නේ ඒකය.
15 සතරවෙනි ගංගාව ප්‍රාත්ය. **ස්වාමිවූ**
දෙවියන්වහන්සේ මනුෂ්‍යයා රැගෙන
ඒදන් උයන වවන්ටත් බලාගන්ටත්
16 එහි පදිංචිකෙරෙවූසේක. **ස්වාමිවූ**
දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥාකර
මින්: නුඹට උයනේ සියලු ගස්වලින්
17 කැමති ලෙස කන්ට පුළුවන; එහෙත්
යහපත හා නපුර දැනගැනීමේ ගහෙන්
කන්ට එපාය; මක්නිසාද එයින් කෑ
දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්
නෙහියයි කීසේක.
18 **ස්වාමිවූ** දෙවියන්වහන්සේ කථා
කොට: මනුෂ්‍යයා තනියම සිටීම හොඳ
නැත; ඔහුට සුදුසු සහකාරියක් සාදා
19 දෙන්නෙමියි කීසේක. **ස්වාමිවූ** දෙවි
යන්වහන්සේ වනයේ සියලු මෘගයන්ද
ආකාශයේ සියලු පක්ෂීන්ද භූමියෙන්

*එනම්, සත්වයෙක්. †හෙවත් ටිග්‍රිස්.
‡නොහොත්, නැගෙනහිරින්.

සාදා මනුෂ්‍යයා උන්ට මොන මොන
නම් තබන්නේදැයි බලන පිණිස උන්
ඔහු වෙතට පැමිණෙවූසේක. මනුෂ්‍යයා
සියලු ජීවමාන සත්වයන්ට තැබූ නම්
උන්ගේ නාමයෝ වූහ. මනුෂ්‍යයා සියලු 20
සිව්පාවුන්ටත් ආකාශයේ පක්ෂීන්ටත්
වනයේ සියලු මෘගයන්ටත් නම් තැබීය;
එහෙත් *මනුෂ්‍යයාට සුදුසු සහකාරියක්
සම්බනොවීය. **ස්වාමිවූ** දෙවියන්වහන් 21
සේ මනුෂ්‍යයාට බරවූ නින්දක් පැමි
ණෙවූසේක, ඔහු නිදාගත්තේය; උන්
වහන්සේ ඔහුගේ ඉළ ඇටවලින්
එකක් ගෙන ඒ ස්ථානය මාංසයෙන්
පිරෙවූසේක. **ස්වාමිවූ** දෙවියන්වහන් 22
සේ මනුෂ්‍යයාගෙන් ගත් ඉළඇටයෙන්
ස්ත්‍රියක් සාදා ඇය මනුෂ්‍යයා වෙතට
පැමිණෙවූසේක. එවිට මනුෂ්‍යයා කථා 23
කොට: මෑ මාගේ ඇටවලින් ඇටය,
මාගේ මාංසයෙන් මාංසයය; මෑ මනුෂ්‍ය
යාගෙන් ගන්නාලද හෙයින් මනුෂ්‍ය ප්‍ර
යයි කියනුලබන්නී යයි කීය. එබැවින් 24
පුරුෂ තෙමේ තමාගේ පියාද මවුද
අත්හැර තම භාර්‍යාවට ඇලුම්වන්
නේය; ඔව්හු එක මාංසයක් වන්නෝය.
තවද මනුෂ්‍යයාද ඔහුගේ භාර්‍යාවද යන 25
දෙදෙනා නග්නව සිටියෝය, නුමුත්
ඔව්හු ලජ්ජා නොවූහ.

## මනුෂ්‍යයා පරීක්ෂාකරනු ලැබීම සහ පාපයට වැටීම

3 සර්පයා වනාහි **ස්වාමිවූ** දෙවියන්
වහන්සේ සෑදූ වනයේ කවර සත්ව
යෙකුටත් වඩා ප්‍රයෝග සහිත වූයේය.
ඌද: ඇත්තටම උයනේ කොයි ගස
කින්වත් කන්ට එපාය කියා දෙවියන්
වහන්සේ කීවාදැයි ස්ත්‍රියගෙන් ඇසීය.
ස්ත්‍රීද: උයනේ ගස්වල ගෙඩි කන්ට 2
අපට පුළුවන; එහෙත් දෙවියන්වහන් 3
සේ—නුඹලා නොනසින පිණිස උයන
මැද තිබෙන ගහේ ගෙඩි කන්ටවත්
ඊට අතගසන්ටවත් එපායයි කීයේ
කැයි සර්පයාට කීවාය. සර්පයාද: නුඹලා 4

*හෙවත්, ආදම්ට.

5 ඇත්තටම නසින්නේ නැත; මක්නි
සාද නුඹලා එයින් කන දවසෙහි නුඹ
ලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා යහ
පත හා නපුර දැනගෙන දෙවියන්වහන්
සේට සමාන වන බවත් දෙවියන්වහන්
6 සේ දන්නාසේකැයි ස්ත්‍රීට කීය. ස්ත්‍රී
වනාහි ඒ ගහ කෑමට හොඳ බවද එය
ඇස්වලට ප්‍රිය බවද නුවණ ලැබීම සඳහා
ආශාවිය යුතු ගහක් බවද දැක එහි ගෙඩි
ගෙන කෑවාය; ඈ තමා සමග සිටි
තමාගේ පුරුෂයාටත් දුන්නාය, ඔහුද
7 කෑවේය. එවිට ඔවුන් දෙදෙනාගේම
ඇස් ඇරී තමන් නග්නව සිටින බව
ඔව්හු දැනගත්තෝය; ඔව්හු අත්තික්
කා කොළ මහා තමන්ට ඉණවැසුම්
8 සාදාගත්තෝය. ඉක්බිති දිවාභාගයේ
සිසිල් වේලේ **ස්වාමිවූ** දෙවියන්වහන්
සේ උයනෙහි සක්මන්කරන ශබ්දය
ඔවුන්ට ඇසුණේය. එවිට මනුෂ්‍යයා
සහ ඔහුගේ භාර්යාව **ස්වාමිවූ** දෙවි
යන්වහන්සේ ඉදිරියෙන් උයනේ ගස්
9 අතරෙහි සැඟවුණෝය. **ස්වාමිවූ** දෙවි
යන්වහන්සේ මනුෂ්‍යයාට හඬගසමින්:
10 නුඹ කොහේදැයි ඔහුට කීසේක. ඔහු:
මට ඔබවහන්සේගේ ශබ්දය උයනෙහි
දී ඇසී මම නග්න බැවින් භයපත්ව
11 සැඟවුණෙමියි කීය. උන්වහන්සේ:
නුඹ නග්න බව නුඹට කීවේ කවුද?
නොකන්ට මා අණකළ ගහෙන් කෑ
12 වෙහිදැයි ඇසූසේක. මනුෂ්‍යයාද: මා
සමග සිටින්ට ඔබවහන්සේ දුන් ස්ත්‍රී
ගහෙන් මට දුන්නාය, මමද කෑවෙමියි
13 කීය. **ස්වාමිවූ** දෙවියන්වහන්සේ: නුඹ
කළ මේ දෙය මොකදැයි ස්ත්‍රියට
කීසේක. ස්ත්‍රීද: සර්පයා මා රැවටුවේය,
14 මම කෑවෙමියි කීවාය. එවිට **ස්වාමිවූ**
දෙවියන්වහන්සේ සර්පයාට කථාකොට:
තා මේක කළ බැවින් සියලු තිරිසනුන්
ටත් වනයේ සියලු සත්වයන්ටත් වඩා
තෝ ශාප ලද්දෙක්ය; තෝ බඩගා
යමින් තාගේ ජීවිතයේ සියලු දවස්
15 වලම ධූලි කන්නෙහිය. මම තා සහ
ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ
ඇගේ වංශය අතරෙහිද සතුරුකම
තබන්නෙමි; ඒ වංශය තාගේ හිස
පොඩිකරන්නේය, තෝ ඔහුගේ විලුඹ
පොඩිකරන්නෙහියයි කීසේක. උන් 16
වහන්සේ ස්ත්‍රියට කථාකොට: නුඹේ
* ශෝකය හා ගැබ්ගැනීම බොහෝ
සෙයින් වැඩිකරන්නෙමි; නුඹ වේදනා
සහිතව දරුවන් වදන්නීය; නුඹේ
ආශාව නුඹේ පුරුෂයා කෙරෙහි වන්
නේය; ඔහු නුඹ කෙරෙහි බලපවත්
වන්නේයයි කීසේක. උන්වහන්සේ 17
ආදම්ට කථාකොට: නුඹේ භාර්යාවගේ
හඬට ඇහුම්කන්දී නොකන්ට මා අණ
කළ ගහෙන් කෑ බැවින් නුඹ නිසා
භූමිය ශාපලද්දීය; නුඹේ ජීවිතයේ සියලු
දවස්වලම නුඹ වෙහෙසින් යුක්තව
එයින් කන්නෙහිය; එය නුඹට කටුද 18
ගොකටුද උපදවන්නේය; නුඹ වනයේ
පලා කන්නෙහිය; නුඹ භූමියෙන් 19
ගන්නාලද බැවින් එයට හැරී යන
තෙක් නුඹේ මුහුණේ ඩහදියෙන් යුක්
තව කෑම කන්නෙහිය; මක්නිසාද නුඹ
දූවිලිය, දූවිල්ලට හැරී යන්නෙහියයි
කීසේක. මනුෂ්‍යයා තමාගේ භාර්යාව 20
ජීවමාන සියල්ලන්ගේ මවූ හෙයින් ඈට
† ඒව යන නම තැබීය. **ස්වාමිවූ** දෙවි 21
යන්වහන්සේ ආදම්ට සහ ඔහුගේ
භාර්යාවට සම්වලින් ඇඳුම් සාදා ඇන්ද
වූසේක.

තවද **ස්වාමිවූ** දෙවියන්වහන්සේ: 22
බලව, මනුෂ්‍යයා යහපත හා නපුර දැන
ගැනීමට අපගෙන් කෙනෙකු මෙන්
වූණේය. දැනුදු ඔහු තමාගේ අත දිගු
කොට ජීවන වෘක්ෂයෙනුත් ගෙන කා
සදාකාලයටම ජීවත්නොවන පිණිසය
කියා, යම් භූමියකින් ඔහු ගන්නාලදද 23
එය වවන පිණිස **ස්වාමිවූ** දෙවියන්ව
හන්සේ ඒදන් උයනෙන් ඔහු පිටකළ
සේක. මෙසේ උන්වහන්සේ මනුෂ්‍යයා 24
පිටත්ට එළවා ජීවන වෘක්ෂයට යන
මාර්ගය රැකවල්කරන පිණිස ඒදන්

* නොහොත්, ගබ්ඕදුරීමේ වේදනාව.
† හෙබ්‍රෙව්: හව්වා, එනම් ජීවමාන, නොහොත් ජීවනය.

උගනට නැගෙනහිරෙන් කෙරුබ්
වරුන්ද හැම අතටම කරකැවෙන්නාවූ
ගිනිමයවූ කඩුවක්ද පිහිටෙවූසේක.

# THE HOLY BIBLE

## SINHALA UNION (OLD) VERSION
## OV 53

© The Ceylon Bible Society

*New Testament – First Published 1931*
*නව ගිවිසුම - පළමු ප්‍රකාශනය 1931*
*The Bible – First Published 1938*
*ශුද්ධ බයිබලය - පළමු ප්‍රකාශනය 1938*

OV 53
3M—1991
ISBN 955-595-000-8

**Permission to reproduce any part of the Sinhala Bible should be obtained from the Ceylon Bible Society, 293, Galle Road, Colombo 3.**

සිංහල බයිබලයේ කිසියම් කොටසක් උපුටා ගන්නේ නම් ශ්‍රී ලංකා බයිබල් සමාගම, අංක 293, ගාලු පාර, කොළඹ 3. වෙතින් අවසර ලබා ගත යුතුයි.

**No portion of this Bible may be stored in any electronic, mechanical or retrieval system without prior written permission from the Ceylon Bible Society.**

සිංහල බයිබලයේ කිසියම් කොටසක්, බයිබල් සමාගමේ ලිඛිත අවසරයක් නොමැතිව, ඉලෙක්ට්‍රෝනික හෝ යාන්ත්‍රික හෝ වෙනත් කිසියම් ක්‍රමයකින් හෝ පිටපත් කර තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

1812 දී පිහිටුවන ලද ලංකා බයිබල් සමාගම, ලෝක ව්‍යාප්ත ජාතික බයිබල් සමාගම් සියල්ලකම සහභාගිත්වයෙන් බිහි වූ එක්සත් බයිබල් සමාගමේ සාමාජිකයෙකු වේ. ලංකා බයිබල් සමාගම, බයිබලය, අලුත් ගිවිසුම සහ බයිබලයෙන් උපුටා ගත් ශුද්ධ ලියවිලි පාඨ, පරිවර්තනය, ප්‍රකාශනය සහ බෙද හැරීම යන කටයුතු වල යෙදී සිටියි. මෙලෙස දේව වචනය පරිහරණය කිරීමට අනුබල දෙයි. ඔබගේ දීමනා හා යාච්ඤා මගින් මෙම සේවයට හවුල්වීමට ඔබටත් ඉඩ ප්‍රස්ථාවක් ඇත. එමගින් කෙරෙන සේවය පිළිබඳ වැඩි විස්තර සැපයීමට ශ්‍රී ලංකා බයිබල් සමාගම කැමැත්තෙන් සිටියි.